# ලුණුගල ප්‍රාදේශීය සභාව 2022.02.22 වන දින පැවති
## මාසික මහ සභා රැස්වීම් වාතර්‍ාව

2022 පෙබරවාරි මස මාසික මහ සභා රැස්වීම 2022.02.22 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

**මෙදින පැමිණිම,**

1. ගරු සභාපති — චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා
2. ගරු උප සභාපති — ධම්මලිංගම් සෙල්වරාණි මැතිනිය
3. ගරු මන්ත්‍රී — මොහොම්මදු ජෙමීල් මෙහොම්මදු ජරෝ මැතිතුමා
4. ගරු මන්ත්‍රී — පෙරියසාමි ලෝගනාදන් මැතිතුමා
5. ගරු මන්ත්‍රී — පලනියන්ඩි සුබ්‍රමනියම් මැතිතුමා
6. ගරු මන්ත්‍රී — ශ්‍රී හස්ත ලේකම්ලාගේ චන්දන සමන් කුමාර මැතිතුමා
7. ගරු මන්ත්‍රී — සුමනාවති මැතිනිය
8. ගරු මන්ත්‍රී — ජෙයකුමාර් පරමසිවම් මැතිතුමා
9. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ අසංක විජේබංඩාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී — පතිරණගේ කුමාරසිරි සමරවීර මැතිතුමා
11. ගරු මන්ත්‍රී — රාමන් ජේයශංකර් මැතිතුමා
12. ගරු මන්ත්‍රී — මුරුගයියා ගනේෂමූතරී මැතිතුමා
13. ගරු මන්ත්‍රී — රෙන්ගසාමි කනගසුන්දරි මැතිනිය
14. ගරු මන්ත්‍රී — රත්නායක මුදියන්සේලාගේ සිරියාවති මැතිනිය
15. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ තිලකසිරි දිසානායක මැතිතුමා
16. ගරු මන්ත්‍රී — මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර මැතිතුමා
17. ගරු මන්ත්‍රී — රාජේන්ද්‍රන් මහාදේවි මැතිනිය
18. ගරු මන්ත්‍රී — වික්‍රමසිංහ ආරච්චි පතිරණලාගේ අනුර වික්‍රමතුංග මැතිතුමා
19. ගරු මන්ත්‍රී — රාජපක්ෂ වත්තේ විදානේලාගේ ඇඩ්වින් මැතිතුමා
20. ගරු මන්ත්‍රී — අබේකෝන් මුදියන්සේලාගේ ජයවීර අබේකෝන් මැතිතුමා

**න්‍යාය පත්‍රයට අනුව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.**

01. **පසුගිය සභා වාතර්‍ාව සභා සම්මත කර ගැනීම**

**01/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

පසුගිය සභා වාතර්ාවෙහි මුදල් හා ප්‍රතිපත්ති කමිටුව හා ප්‍රසම්පාදන කමිටුවෙහි සාමාජිකයන් ලෙස ගරු මන්ත්‍රී අනුර වික්‍රමතුංග මැතිතුමා හා ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා සුදුසු බවට මා විසින් යෝජනා කළ බව සඳහන් වී තිබෙන අතර එය සංශෝධනය විය යුතු බව පැවසීය.

**2022.01.18 වන දින පැවති මහ සභා රැස්වීම් වාතර්ාව ඉහත සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු බවට ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාතර්ාව ඒකමතිකව සම්මත විය.**

**02. ගරු සභාපතිතුමාගේ නිවේදන :- නැත**

**03. සංදේශ/ පෙත්සම්/ පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.**

**03/1.** පල්ලේකිරුව ග්‍රාම නිළධාරි වසමේ පවුල් සෞඛ්‍ය නිළධාරිණි එම්.එස්.ජයමාලි මහත්මිය විසින් යොමු කරන ලද " සායන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරිම සම්බන්ධව" යන ලිපිය ගරු මන්ත්‍රී අසංක විජේබංඩාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/2.** උඩකිරුව,ශ්‍රී සරණංකර දහම් පාසලේ ප්‍රධානාචාර්ය ඒ.එම්.ඒ.අත්තනායක මහතා විසින් යොමු කරන ලද " පරණ දහම් පාසල් ගොඩනැගිල්ලට සෙවිලි ෂීට් ලබා ගැනිම සඳහා" යන ලිපිය ගරු මන්ත්‍රී තිලකසිරි දිසානායක මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/3.** ඇකිරිය, බකිණිලන්ද,වෙහෙරගොඩ හි පදිංචි ශ්‍යාමලි දිල්හානි දිසානායක මෙනවිය විසින් යොමු කරන ලද " වැටුපක් ලබා ගැනිම සඳහා" යන ලිපිය ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/4.** මඩොල්සිම, ශ්‍රී උපනන්ද දහම් පාසලේ ප්‍රධානාචාර්ය ස්වාමින් වහන්සේ විසින් යොමු කරන ලද "ශ්‍රී උපනන්ද ශාස්ත්‍රිය සංග්‍රහය එළිදැක්විම සම්බන්ධවයි" යන ලිපිය ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/4.** ලුණුගල, ෂෝලන්ඩ්ස් උඩ කොටස ශ්‍රී භද්‍රකාලි අම්මන් දේවාලයේ භාරකාර මණ්ඩලය විසින් යොමු කරන ලද " දේවාලයේ ඉදි කිරිම් කටයුතු සඳහා ආධාර ලබා ගැනිම සම්බන්ධවයි" යන ලිපිය ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/5.** ලුණුගල, අරවාකුඹුර හි පදිංචි කේ.කන්දයියා මහතා විසින් යොමු කරන ලද " නිවාස ආධාරයක් ලබා ගැනිම සම්බන්ධවයි" යන ලිපිය ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/6.** ලුණුගල, ජනතාපුර, ජේරවත්ත හි පදිංචි ආර්.එම්.කාංචනා දිල්රුක්ෂි මහතා විසින් යොමු කරන ලද " නිවාස ආධාරයක් ලබා ගැනිම සම්බන්ධවයි" යන ලිපිය ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/7.** ලුණුගල පොලිස් ස්ථානය අලුත්වැඩියා කිරිම සම්බන්ධවයි" යන ලිපිය ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**03/8.** මඩොල්සිම, ඌවකැලේ වත්ත හි පදිංචි පලනියන්ඩි මනොහරන් මහතා විසින් යොමු කරන ලද රැකියා අවස්ථාවක් ලබා ගැනිම සම්බන්ධවයි යන ලිපිය ගරු උප සභාපති ඩී.සෙල්වරාණි මැතිණිය විසින් සභාපට ඉදිරිපත් කරන ලදි.

**04. කල් දී ඇති ප්‍රශ්ණ :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/1.** 2019 ජනවාරි සිට 2022 පෙබරවාරි 20 දක්වා ප්‍රාදේශිය සභා බහුකාර්ය ගොඩනැගිල්ල කුලයට ලබාදී,

I. ලැබුන ආදායම
II. ලබාගත් අයගේ නම, ලිපිනය, ජා.හැ.අ.
III. ලබාගත් දිනය

IV. එම දිනයට අදාළ ගෙවීම සඳහා නිකුත් කළ ලදුපත් අංකය සහ මුදල, දිනය, ලදුපත් ඡායාපිටපත

V. ගොඩනැගිල්ල, භාණ්ඩ සඳහා ප්‍රතිපූර්ණ වූ අලාභ ප්‍රමාණය

VI. සහභාගීවූ ගනන

VII. වෙන් කර ගත්තේ කුමන කාර්යක් සඳහාද?

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඊට අදාළ පිළිතුරු ලිඛිතව ලබා දෙන ලදි.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/2.** 2018, 2019, 2020, 2021, 2022 ජනවාරි දක්වා ලුණුගල ප්‍රාදේශිය සභාවේ ප්‍රතිපාදන වලින් සභාපතිතුමා ඇතුලු සභික සභිකාවියන් ජනතාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක කළ සංවර්ධන යෝජනා, සමිති, ආගමික ස්ථාන ඇතුලු සියලුම ප්‍රතිලාභ වාතර්ාවක් ලබාදෙන්න. එම භාණ්ඩ හා සේවා ලබාගත් බවට ලබාගත් සහතික ලිඛිතව ලබාදෙන්න (පුද්ගලික)

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

දින 02 ක් ඇතුලත සියලු පිළිතුරු ලිඛිතව පුද්ගලිකව ලබා දෙන්නම්.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/3.** 2022 ජනවාරි ජල බිල්කල ලීටර් සහ මුදල් ප්‍රමාණය 2022 ජනවාරි එකතු කරන ලද මුදල

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඊට අදාළ පිළිතුරු ලිඛිතව ලබා දෙන ලදි.

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/4.** 2020 වෂර්යේ සිට 2022 ජනවාරි 31 දක්වා පහත සඳහන් ලුණුගල ප්‍රාදේශිය සභාවට අයවිය යුතු මුදල් ප්‍රමාණය

I. ගවමස් කඩය (සෝගාතකාගාරයෙන් ලැබුනු මුදල ඇතුලු සියලුම ආදායම)

II. කරදිය මාලු කඩ ලුණුගල, මඩොල්සිම
ජංගම දිනපතා අයකල මුදල දිනය සමඟ

III. මිරිදිය මාලු කඩ ලුණුගල, මඩොල්සිම
ජංගම දිනපතා අයකල මුදල දිනය සමඟ

IV. සතිපොල ලුණුගල, මඩොල්සිම
දිනපතා අයකළ මුදල් අයකළ දින

V. බැකෝ ලෝඩර් යන්ත්‍රයේ දිනපතා අයකල මුදල, වැඩ කල පැය ගණන
2020 - 2021 සම්පූණර් ආදායම
සම්පූණර් වියදම (යන්ත්‍ර ක්‍රියාකරු, සහයක, ඩීසල්, රක්ෂණ, ටයර් සේවා ඇතුලු සියලුම වියදම්)

**පිළිතුරු.**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

11.**2021 වෂර්ය**

| | |
|---|---|
| ලැබුණු මුදල් ප්‍රමාණය | :- රු.166732.68 |
| අයවිය යුතු මුදල් ප්‍රමාණය | :- රු.183274.66 |

**2022 වෂර්ය**

| | |
|---|---|
| ලැබුණු ටෙන්ඩර් ඇප තැන්පත් 1/3 | :- රු.125002.86 |
| අයවිය යුතු මුදල් ප්‍රමාණය | :- රු.41667.62 |

111. **2021 වෂර්ය**

| | |
|---|---|
| ලැබුණු මුදල් ප්‍රමාණය | :- රු.150041.77 |
| අයවිය යුතු මුදල් ප්‍රමාණය | :- රු.102028.54 |

**2022 වෂර්ය**

| | |
|---|---|
| ලැබුණු ටෙන්ඩර් ඇප තැන්පත් 1/3 | :- රු.81023.85 |
| අයවිය යුතු මුදල් ප්‍රමාණය | :- රු.27007.95 |

**මඩොල්සීම මාළු වෙළඳසැල**

ලැබුණු ටෙන්ඩර් ඇප තැන්පත් 1/3 :- රු.180249.99

අයවිය යුතු මුදල් ප්‍රමාණය :- රු.60083.33

**2021 වෂර්ය**

දෛනික මාළු අලෙවිය :- රු.6940.00

**IV.** සතිපොල ලුණුගල

ලැබුණු මුදල් - රු.19950.00

2022.01.03 - රු.2350.00

2022.01.10 - රු.4400.00

2022.01.18 - රු.3200.00

2022.01.24 - රු.5500.00

2022.01.31 - රු.4500.00

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/5.** ලුණුගල ප්‍රාදේශීය සභාව නිමර්ානය කළ ආදායම් මාගර්. එම ආදායම් වලින් ලැබුණු ප්‍රමාණය 2020 - 2021.

ජනතාපුර වෙළද සංකීණර්ය

ලුණුගල පොදු වෙළඳපල

මඩොල්සීම සතොස ආයතනය

**04/1/6.** මාගේ යෝජනාවන් අනුව ක්‍රියාත්මක නයි මිරිස් වගාවේ වතර්මාන තත්ත්වය

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මේ වනවිට වගා මාධ්‍ය සකස් කොට අවසන් අතර බීජ/පැළ ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**05. කල් දී ඇති යෝජනා :-**

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/1.** ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මඩොල්සීම නගරය දැනට සංවධර්න කටයුතු කරමින් පවතින අතර, මඩොල්සීම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභා උප කායර්ාලයක් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

නව රජයේ රැකියා අවස්ථා සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට මෙම රජය තීරණයක් ගෙන තිබෙනවා. මඩොල්සීම උප කායර්ාලය ස්ථාපිත කරන්නේ නම් කායර් මණ්ඩලයක් ද පවත්වා ගත යුතුයි. නමුත් සභාවේ ආදායම් තත්ත්වය මත අලුතින් කායර් මණ්ඩලය බඳවා ගැනිම ගැටළු සහගත නොවන්නේද?

**ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා.**

දැනට පවතින උප කායර්ාලය ගරු උප සභාපතිතුමියගේ කායර්ාලය බවට පත් වී තිබෙනවා. කෙසේ නමුත් උප කායර්ාලයක් ස්ථාපිත කරන්නේ නම් එහි කායර් මණ්ඩලයක් පවත්වා ගැනිම අත්‍යාවශ්‍ය කාරණයකි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරූක් මැතිතුමා.**

උප කායර්ාලයක් ස්ථාපිත කිරිම වැදගත් කරුණක් වුවද නව කායර් මණ්ඩලයක් බඳවා ගැනිම අනුමත කළ නොහැකිය. එසේ වන්නේ නම් එහි බර දැනෙන්නේ අප කොට්ඨාශයේ අසල්වැසි ජනතාවටය. මේ වන විට අප ආයතනයේ දීමනා පදනම මත සහ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් යොදවා තිබෙන සේවයකින්ද සේවයේ යෙදෙන බැවින් ඔවුන් යොදවාගෙන මෙම උප කායර්ාලය ආරම්භ කළ හැකිය.

2011 වසරේදී මෙම ප්‍රාදේශීය සභාව ආරම්භ කිරිමේදි පැවති සේවක මණ්ඩලය යොදවා ගෙන ආරම්භ කළ අතර අලුතින් කායර් මණ්ඩලය ලබා ගත්තේ නැත. ක්‍රමයෙන් බඳවා ගැනිම සිදු කිරිම සුදුසු බවයි මගේ හැඟිම.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙම ඉදි කිරිම් අවසානයේදී අප සභාවට රු.ලක්ෂ 05 – 06 ක පමණ ස්ථිර ආදායම් මාගර්යක් ලැබෙනවා. එය වාෂර්ිකව වැඩි වන ආදායම් ක්‍රමවේදයකි.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

මඩොල්සීම උප කායර්ාලය ස්ථාපිත කිරිමට එකඟ නමුත් අලුතින් කායර් මණ්ඩලය බඳවා ගැනිමට එකඟ වන්නේ නැත.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙම කායර්ාලය ස්ථාපිත කිරිමට අවශ්‍ය ඉඩම් කොටස ලබා දුන්නේ ප්‍රාදේශිය ලේකම්තුමා විසිනි. රු.ලක්ෂ 130 ක පමණ වටිනාකමක් මේ සඳහා ලැබි තිබේ. මෙතරම් විශාල ප්‍රතිපාදනයක් රජයෙන් නොලැබෙන පසුබිමක මෙම සංවිධානය මඟින් සිදු කල මෙම කායර් වෙනුවෙන් අප ස්තුතිය පුදකළ යුතුයි.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

ඉඩම අප ආයතනය සතු නොවේ නම් අනවසර ඉඩමක ඉදි කිරිමක් සිදු කිරිම නීත්‍යානුකූල නොවන්නේද? එය ගැටළුකාරි තත්ත්වයකි. එසේ සභාව සතු මුදලින් යම් ඉදි කිරිමක් සිදු කරන්නේ නම් අප සියල්ලටම අධිභාරයන්ට ලක් වීම නොවැලැක්විය හැකිය.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/2.** නව දෙමහල් සංකීණර්ය ඉදිකිරීමට නියමිත හේතුවෙන්, බස්නැවතුම්පල කඩකාමර ඉවත් කළ බැවින්, ඒවායේ බිල්කිරීම් නතර කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/3.** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2022.01.13 වන දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 ට අනුව දෛනික/අනියම්/ආදේශක වැටුප් ලබන සේවකයින් සඳහා රු.5000.00 ක දීමනාව ගෙවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

පෙර පාසල් ගුරුවරියක ලෙස කිසිදු දීමනාවක් හෝ නොලබා දහවල් 11-12 වනතුරු කුඩා දරුවන් එක්ක ගත කරන කාලය සුළුපටු නොවේ. ඔවුන් සිදු කරන්නේ සුවිශේෂි වූ සේවාවක්.කිසිදු පෙර පාසලක මා විසින් යෙදවූ කිසිම ගුරුභවතෙකු නොමැති බවත් මානුෂියව සිතා බලා සියලු පෙර පාසල් ගුරුභවතුන් වෙත රු.5000.00 දීමනාව ලබා දීමට කටයුතු සළසන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

බොහෝ පෙර පාසල් ප්‍රාදේශිය ලේකම් කායර්ාලයෙන් පාලනය වන නිසා සභාව මඟින් පාලනය වන පෙර පාසල් 06 ට පමණක් දීමනාව ලබා දීමට කටයුතු කරමු. දැනට වසර 02 – 03 ට මණ පෙර පෙර පාසල් විෂය අප ආයතනයෙන් ඉවත් කොට තිබෙනවා.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

දෛදනික/අනියම්/ආදේශක වැටුප් ලබන සේවකයින් කොපමණ සංඛ්‍යාවක් සභාවේ සේවය කරනවාද?

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

27 දෙනෙකු සේවයේ යෙදෙනවා.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/4.** ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවයේ නියුතු සේවක මහතුන් වෙත 2022 වෂර්ය සඳහා දෛනික වැටුප් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මම සුරියගොඩ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පරික්ෂා කල අතර එහිදි සේවක පැමිණිම් ලේඛනය ප්‍රධාන කායර්ාලයේ තිබිය යුතු වුවත් එය එම ස්ථානයේ පවතින බවත් ඔවුන් මාසය අවසානයේදී පැමිණිම් වාතර්ාව සකස් කොට විෂය නිළධාරියාට ලබා දිය යුතු බවත් නිරික්ෂණය විය. එම ක්‍රමවේදය ගැටළුකාරි බැවින් විෂය නිළධාරිගේ පුණර් අධික්ෂණය මත එම පැමිණිම් ලේඛනය විධිමත් පරිදි නඩත්තු කළ යුතු බවත් ප්‍රකාශ කරමි.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/5.** ලුණුගල පොදු වෙළඳපල අංක 16 දරණ කඩකාමරයේ බදුකරු වන ඩී.එම්.නන්දාවති මිය වෙත කුලී මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් බදුල්ල දිසා අධිකරණයේ කඩු අංක M/8722 යටතේ නැවත නඩු ගොනු කර ඇති බැවින්, එයට සභාවේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා**

මේ සම්බන්ධව එක නඩු වාරයක් පැවත්වුවා නේද?

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එය අඩුපාඩු හේතුවෙන් නිෂ්ප්‍රභා කළා. එබැවින් නැවතත් නඩුවක් ගොනු කරා.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

නිෂ්ප්‍රභා කිරීම තුලින් අප ආයතනය වෙත අවාසි සහගත තත්ත්වයක් උද්ගතවනවා නේද? එබැවින් හිඟ මුදල් අය කර ගැනීම හෝ දේපල පවරා ගැනීම සිදු කළ යුතුයි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ගැටළු ලෙස දක්වා තිබෙන්නේ ගිවිසුම් ගත වීමේ අඩුපාඩුවකි. කෙසේ නමුත් හිටපු සභා ලේකම්තුමා සමඟ එක්ව එහි ගැටළු කිහිපයක් නිරාකරණය කිරීම සිදු කළා.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මේ සම්බන්ධ ලිපිලේඛන සුරක්ෂිතව තබා ගන්න. එක් ලිපියක් හෝ අස්ථාන ගත වුවහොත් එහි අවාසිය අප සතු වේ. එසේම නිසි නීතිඥවරයෙකු හට නඩුව භාර දෙන්න.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/6.** මඩොල්සිම පුස්තකාල ගොඩනැගිල්ලෙහි ඉහල මහලයේ මඩොල්සිම සතොස ගොඩනැගිල්ලක් ඉදිකිරීමටත්, එම ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට ලුණුගල ප්‍රාදේශීය සභාවේ ස්ථාවර තැන්පත් ගිණුමෙහි මුදල් ලබාගැනීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඉඩම් කොමසාරිස්තුමා විසින් එම ඉඩම් කොටස අප වෙත නිත්‍යානුකූලව ලිඛිතව පවරා දී තිබෙනවා.එසේම මෙම ඉදි කිරීම් කටයුතු නවතන ලෙස මා වෙත දුරකතන ඇමතුම් කිහිපයක්ම ලැබුනි. එහිදී මා පවසා සිටියේ අප බල ප්‍රදේශය සංවර්ධනය කිරීම් කටයුතු නොනවත්වා සිදු කරන බවත්, එහි නීත්‍යානුකූලභාවය පිළිබඳව ගැටළුවක් පවතින්නේ නම් තමා අධිකාරයන්ට යටත් වන බවත්ය. තවද මඩොල්සිම ප්‍රදේශයට එම ගොඩනැගිල්ල අවශ්‍ය නොවන්නේ නම් වෙනත් ස්ථානයක එම ගොඩනැගිල්ල ඉදි කරන බවත් වැඩිදුරටත් පැවසීය.

**ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා.**

ගරු මන්ත්‍රීවරුන් විසින් මෙම ඉඩමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව ගැටළු මතු කිරීම සාධාරණය.මන්ද ආරම්භක අවස්ථාවේදී එම ඉඩම අප සතු නොවූ අතර එය ප්‍රාදේශීය ලේකම් සතු ඉඩමකි. එහිදී මෙම ඉදි කිරීම් ආරම්භයේදි භූමිය සකස් කිරීමේදි ගැටළු මතු වූ අතර ප්‍රාදේශීය සංවර්ධන කමිටුව වෙත මෙම ගැටළුව යොමු කිරීමෙන් අනතුරුව තීරණය වුයේ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් ඉඩම් කොටස අප ආයතනය වෙත පවරා දිය යුතු බවයි.ඒ අනුව පර්චස් 12.7 ක් අප වෙත නීත්‍යාකූලව පවරා දෙන ලදි. ඉන් අනතුරුව වලර්ඩ් විෂන් ආයතනය හා එක්ව මෙම ගොඩනැගිල්ල ආරම්භ කිරීම් කටයුතු සිදු කරන ලදි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

මෙම ඉඩම් කොටස පවරා දෙනු ලැබුවේ මෙම ගැසට් පත්‍රය මඟිනි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එම ගැසට් පත්‍රය 1999 වසරේදි ප්‍රකාශයට පත් කල අතර එහි දක්වා තිබෙන්නේ ඉඩම් බලතල ප්‍රාදේශීය ලේකම්තුමා වෙත පවරා දි ඇති බවයි. මෙම ගැටළුව මතු වූ අවස්ථාවේදී LRC මඟින් ප්‍රාදේශීය ලේකම්තුමාට උපදෙස් ලබා දෙනු ලැබුවේ මෙම ඉඩම් කොටස විධිමත්ව ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙසයි.එසේම ප්‍රදේශයේ ඉඩම් බලතල ඇත්තේ ප්‍රාදේශීය ලේකම්තුමාටය. කෙසේ නමුත් මඩොල්සිම නගරයේ සතොස ආයතනය ඉදි කිරීම සඳහා සියලු කටයුතු සුදානම් කර අවසන් අතර මෙම වසරේ අප්‍රේල් මස අවසන් වීමට පෙර එම ආයතනය විවෘත කිරීමට බලාපොරොත්තු වෙමි. එබැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.පරුක් මැතිතුමා.**

සතොස ගොඩනැගිල්ල සාදා නිම කරන්නට ප්‍රතිපාදන ලබා දෙන්නේ වලර්ඩ් විෂන් ආයතනයෙන්ද?

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

සභාවට ආදායම් මාගර්යන් උත්පාදනය කිරිමේ අරමුණින් සභාව සතු ස්ථාවර තැන්පත් ගිණුමෙන් මුදල් ප්‍රතිපාදන ලබා ගැනිමට අපේක්ෂා කරන අතර ඒ සදහා සභාවේ එකඟතාවයක් නොලැබෙන්නේ නම් එම මුදල් ගිණුමෙහිම පවත්වා ගැනීමට කටයුතු කරමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මෙවැනි ඉදි කිරිම් වෙනුවෙන් රජයෙන් ප්‍රතිපාදන ලබා දෙන්නේ නැද්ද?

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මෑත කාලයේදී ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොවිය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

හිටපු සභා ලේකම්තුමාගේ පාලන කාලයේදි රු.ලක්ෂ 80 ක් සමන්විත මෙම ස්ථාවර ගිණුමෙන් නැවත බැංකුගත කිරිමේ අරමුණින් ලක්ෂ 40 ක් ලබා ගත් අතර එම මුදල නැවත බැංකුගත කිරිමක් ද සිදු නොවිය. එහිදි ලක්ෂ 40 ක ඉතුරුවක් තිබු අතර එයද ආපසු ලබා ගන්නේ නම් දිනෙන් දින සභාව අස්ථාවර භාවයට පත්වීම නොවැළැක්විය හැකි තත්ත්වයකි.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මෙම සියලු කාය‍ර්යන්හි ප්‍රධාන අරමුණ සභාවට නව ආදායම් මාගර්යන් උත්පාදනය කිරිමයි. ඉදිරියේදි ලක්ෂ 200 ක මුදල් ප්‍රතිපාදන ද අප සභාවට ලැබීමට නියමිතය. එහි සියලු ප්‍රතිලාභයන් ලැබෙන්නේ ලුණුගල ප්‍රදේශවාසින්හටය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මෙවැනි ගැටළුකාරි අවස්ථාවන්හිදි අදහස් දැක්විම් සිදු කිරිමේදි මඩොල්සිම ප්‍රදේශයට ප්‍රතිලාභ ලබා දීමට මා විරුද්ධයි කියා වැරදි අථර්කතනයක් ලබා නොදෙන්න.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා.</u>**

මෙම ඉදි කිරිම් විධිමත්ව හා නීත්‍යානුකුලව සිදු කරගෙන යන විට ඒ සදහා ගැටළු මතු නොකරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා</u>**

මඩොල්සිම නගරය සංවධර්නය කළ යුතුයි කියා අවස්ථා ගණනාවකදීම මා විසින් මෙම සභාවට කරුණු දක්වා ඇති අතර එම ප්‍රදේශයේ ගරු මන්ත්‍රී එම්.ගනේෂුතරී මැතිතුමා පිළිබදව මඩොල්සිම ජනතාව අතර ඇත්තේ අප්‍රසාදයකි. අප සභිකයින් වශයෙන් මඩොල්සිම ප්‍රදේශයට ආදරය කරනු ලබන අතර එම ප්‍රදේශය ද සංවධර්නය කළ යුතුයි යන මතයේ සිටින්නෙමු.කෙසේ නමුත් විශාල ගැටළු ගණනාවක්ම මඩොල්සිම ප්‍රදේශයෙහි උද්ගතව තිබිම කණගාටුවට කරුණකි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මඩොල්සිම නගරය පිළිබදව අදහස් දැක්විමට ගරු මන්ත්‍රී එම්.ගනේෂුතරී මැතිතුමාට මෙන්ම අප හටද අයිතියක් තිබෙනවා.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

අප සභාවට ආදායම් උත්පාදන මාගර් සකස් නොකරන බව සෑම අවස්ථාවකදිම පාහේ චෝදනා එල්ල කරනු ලබන අතර එම අවස්ථා නිමර්ාණය කරන විට විරුද්ධ වීම පිළිබදව කණගාටු වෙමි. මුදල් ස්ථාවර තැන්පතු ලෙස පවත්වා ගැනිම එලදායි නොවන අතර ආදායම් මාගර් නිමර්ාණය කිරිම තුලින් ප්‍රතිලාභ හිමි වනුයේ ද ලුණුගල ප්‍රදේශයේ ජනතාවයටය.

**<u>ගරු මන්ත්‍රී ජයවිර අබේකෝන් මැතිතුමා</u>**

උප කායර්ාලයකට අවශ්‍ය ගොඩනැගිල්ල හා උපකරණ වලර්ඩ් විෂන් ආයතනයෙන් ලැබි තිබෙනවා.එය සතුටුදායක කරුණකි. එහි ප්‍රතිලාභ හිමිවන්නේ ප්‍රදේශයේ ජනතාවයටය. එය ද සභාවේ වත්කමකි. එසේම එම උප කායර්ාලය සඳහා සේවකයින් යෙදවීමේදි දැනට සේවයේ නියුතු සේවකයින් ඒ සඳහා යොදවා කළමනාකරණය කිරිම වැදගත්ය. ඒ සඳහා පුණර් දායකත්වය ප්‍රධාන කායර්ාලයෙන් ලැබිය යුතුය.ඒ තුලින් මඩොල්සිම ප්‍රදේශයට ප්‍රතිලාභයක් සලසමු.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.</u>**

සභාව සතු ස්ථාවර වත්කම් මුදලින් යම් මුදලක් ආපසු ලබා ගන්නේ නම් ඒ පිළිබදව සභාවේ ගරු මන්ත්‍රිවරුන් දැනුවත් කළ යුතුය.එසේම ඒ වෙනුවෙන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. මන්ද ඒ පිළිබදව යම් ගැටළුවක් උද්ගතවුවහොත් අප සියලුදෙනාම වගකිව යුතු වන බැවිනි. එහිදි සභා ලේකම්තුමාගේ වගකීම වනුයේ සභික මණ්ඩලය විනිවිදභාවයකින් යුතුව නිසි පරිදි දැනුවත් කිරිමයි.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මෙය මාස 06 ක් පුරාවට ඇදී ගිය ගැටළුවකි. කිසිදු පුද්ගලයෙකු මේ පිළිබදව කතා කලේ නැත. ප්‍රාදේශිය ලේකම්තුමාගේ පුණර් මැදිහත්විමෙන් අනතුරුව මෙම ගැටළුව විසදා ගනු ලැබුවා. මේ වන විට පචර්ස් 12.7 ක ඉඩම් කොටසක් සභාව සතුවී අවසානයි. ඒ පිළිබදව සතුටු විය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී තිලකසිරි දිසානායක මැතිතුමා</u>**

පසුගිය කාලයේදී බොහෝ දෙනෙකු මඩොල්සිම ප්‍රදේශය සංවධර්නය කළ යුතුයි කියා කිඹුල් කඳුළු හෙලනු ලැබුවා. මේ වන විට මෙම යෝජනාව සදහා විරුද්ධ වනවා නම් විරුද්ධ විය යුත්තේ අපයි.මන්ද මෙතරම් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් අපේ ගම් ප්‍රදේශ සංවධර්නය කිරිමට අපට ලැබි නොමැත.

මඩොල්සීම ප්‍රදේශයේ සතොස ආයතනයක් ස්ථාපිත කිරීම තුලින් අප ප්‍රදේශයට සෘජු ප්‍රතිලාභයක් නොමැති වුවද මඩොල්සීම ජනතාවට එය මහත් අස්වැසිල්ලකි. එසේම වතර්මාන සේවක මණ්ඩලය ද කළමනාකරණය කර ගනිමින් එම ආයතනයන් ස්ථාපිත කිරීම සුදුසු බවයි මගේ හැඟීම. ඒ තුලින් සභාවට ආදායමක් ලැබෙනවා මෙන්ම ජනතාවට ද සේවයක් ලැබෙනු ඇත.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මඩොල්සීම සතොස ආයතනය සඳහා මුල්ගල තැබීමේ උත්සවය පැවති දින උදෑසන 8.45 ට පමණ ඒ සඳහා සහභාගී වන ලෙස දන්වමින් මා වෙත දුරකතන ඇමතුමක් ලැබුනි. ගරු සභාපතිතුමාට එතැන් සිට කිහිප අවස්ථාවකදීම දුරකතනයෙන් සම්බන්ධ වීමට උත්සහ ගත්ත ද ඔබතුමා ප්‍රතිචාර දැක්වූයේ නැත. එබැවින් මා රු.2500.00 ක මුදලක් ගෙවා කුලී ත්‍රී රෝද රථයකින් එම අවස්ථාව සඳහා සහභාගී වුවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා.</u>**

මඩොල්සීම ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉහල මාලයෙහි වෙළඳසැල් ඉදි කර කුලී පදනම මත ලබා දෙන බවට මඩොල්සීම ජනතාව අතර මතයක් ගොඩනැගී තිබෙනවා. එසේ වුවහොත් ගැටළුකාරී තත්ත්වයකට මුහුණපෑමට සිදු වනවා. එසේම ඉහල මාලය සතොස ආයතනයක් ස්ථාපිත කිරීම පිළිබඳව මා පසුගිය සභා වාරයන්හිදි ද අදහස් දැක්වුවා.මා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනුයේ මෙම යෝජනාව සඳහා විරුද්ධ නොවී එකඟතාවය ලබා දෙන ලෙසයි.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා.</u>**

මඩොල්සීම නගරය ක්‍රමයෙන් ජනාකීණර් මෙන්ම සංවධර්නය වනු ලබන නගරයකි.එසේම අස්වැන්න සඳහා වැ ඩි මිළක් ගෙවීම හේතුවෙන් මෙම නගරය වෙත මීගහකිවුල ප්‍රදේශයේ සිට ද ගොවි ජනතාව පැමිණෙනවා. එවැනි නගරයක් සඳහා අප සභාවෙන් මුදලක් ආයෝජනය කරමින් මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ප්‍රදේශවාසින් වෙත මහත් අස්වැසිල්ලක් වනවා නොඅනුමානය. අප මෙම ධූරයෙන් ඉවත්ව ගිය ද ආයතනයේ පැවැත්ම වෙනුවෙන් යම් කායර්යක් ඉටු කල හැකි වන්නේ නම් එය වැදගත් වනු ඇත.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

සියක් නගර ව්‍යාපෘතිය මඟින් මඩොල්සීම නගරයේ සංවධර්න කටයුතු මාතර්ු මාසයේදී ආරම්භ කිරීමට නියමිතය. එවිට ඉඩම් අක්කර 02 ක් නිදහස් කර අප ආයතනය සතු වේ.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා.</u>**

පසුගිය දිනෙක පස්සර පොලිස් ස්ථානයේදී පැවති සාකච්ඡාවකදී මතු කල කරුණක් වූයේ ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා දිඝර්කාලයක් පුරා මතු කළ ප්‍රමුඛ යෝජනාව ගනු ලබන පුංචිලෝකාන්තය සම්බන්ධව සාකච්ඡා කෙරුනේ අප සභාවට පවරා ගත නොහැකි නම් එය පස්සර ප්‍රාදේශිය සභාවට පවරා දෙන ලෙසයි. එසේම සිය දහස් ගණනින් සංචාරකයින් පැමිණෙන පුංචි ලෝකාන්තය අප ආයතනය වෙත ලබා ගෙන ආදායම් මාගර්යක් සකස් කර ගැනිමට එකාවන්ව සටන් කල යුතුය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මඩොල්සීම ප්‍රදේශයේ සතොස ආයතනයක් ස්ථාපිත කිරීමට විරෝධතාවයක් නොමැති අතර සභාවේ මුදල් යොදවන නිසා විධිමත් ක්‍රමයකට කමිටුවක් පිහිටුවා එහි වාතර්ාවක් ලබා ගෙන නීත්‍යානුකූලව ලිපි ලේඛණ ද සභා ගත කළ කරන්නේ නම් එපි එකඟ වනවා.

**<u>ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මෙවැනි අකටයුතුකම් හමුවේ අප සියලු දෙනාටම අධිහාරයන්ට යටත් වීම නොවැලැක්විය හැකි කරුණක් වනු ඇත. එසේම එවැනි අධිහාරයන් සඳහා අප වග නොකියන බව මා මෙම ගරු සභාව වෙත වගකීමෙන් යුතුව ප්‍රකාශ කර සිටිමි.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

රු.ලක්ෂ 130 ක් රාජ්‍ය නොවන සංවිධානයක් මඟින් ලබා දීම පිළිබඳව සභාවේ ස්තූතිය හිමි විය යුතුයි. එසේම මිල්කෝ ආයතනයේ ශාඛාවක් 01 වෙනි දින යපම්ම ප්‍රදේශයේ ආරම්භ කිරීමට නියමිතයි.

**<u>ගරු උප සභාපති ඩී.සෙල්වරාණි මැතිණිය.</u>**

මඩොල්සීම ප්‍රදේශය සංවධර්නය කළ යුතු යැයි සෑම සභා වාරයකදීම ප්‍රකාශ කලද ක්‍රියාවෙන් සිදුවීමක් දක්නට නොලැබුණි. එබැවින් සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත මෙම සතොස ආයතනය මඩොල්සීම ප්‍රදේශයේ ආරම්භ කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී තිලකසිරි දිසානායක මැතිතුමා</u>**

පුංචි ලෝකාන්තය, බේසම, පීස්ස වැනි සංචාරක ස්ථාන ද කඩිනමින් අප සභාව වෙත ලබා ගත යුතුයි. ඒ තුලින් ආදායම් උත්පාදනය කිරිම කළ යුතු අතර මේ වනතුරු එය ක්‍රියාත්මක නොකිරිම පිළිබඳව කණගාටුව පළ කරමි.

**ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා**

මඩොල්සිම ප්‍රදේශය සංවධර්නය කළ යුතුයැයි මා විසින් අවස්ථා කිහිපයකදීම යෝජනා ඉදිරිපත් කොට තිබෙනවා.එහිදි සතොස ඉදි කිරිමට යෝජිත බිම් කොටස පිළිබඳව යම් යම් හේතුන් මත ජනතාව අතර එතරම් පැහැදීමක් නොතිබුනි. මඩොල්සිම කොටසද අප කොට්ඨාශයට අයත් ප්‍රදේශයකි. එබැවින් එම ප්‍රදේශය ද කඩිනමින් සංවධර්නය කළ යුතුයි. එම ආයතනය ස්ථාපිත කිරිමට මුල් ගල තැබු නිසා අනිවායෙර්න්ම ඉදි කළ යුතුයි. කඩිනමින් ඇස්තමේන්තුව සකස කර එය සභාවට යොමු කරන්න. අනුමැතිය ලබා ගැනිමෙන් අනතුරුව ඉදි කිරිම් ආරම්භ කිරිම සුදුසු බවයි මගේ හැඟිම.

**ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා.**

සභා අරමුදලින් ඉදි කිරිම් සිදු කරන නිසා සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ ඒකමතික එකඟතාවය ලබා ගත යුතුයි. කෙසේ නමුත් මුල් ගල තබන අවස්ථාව පිළිබඳව කොට්ඨාශය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයා ලෙස මා දැනුවත් කිරිම නොකිරිම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඒ පිළිබඳව සභා වාරයකදී දැනුවත් කලා. එබැවින් පුද්ගලිකව ආරාධනා කළේ නැත.

**ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා.**

2020 කොඩිව් වංසගත තත්ත්වය පැවති සමයේ දී සහන මිළට බඩු මල්ලක් බෙදු අවස්ථාවේදීම මඩොල්සිම ප්‍රදේශයට සතොස ආයතනයක අවශ්‍යතාවය ඉස්මතු විය. සතොසින් ලැබෙන සහන මිළට මඩොල්සිම ජනතාවට ද්‍රව්‍ය මිළදී ගැනීමට නොහැකියි. තවද මඩොල්සිම ප්‍රදේශයේ සතොස ආයතනයක් ස්ථාපිත කිරිම පිළිබඳව මාගේ සතුට ප්‍රකාශ කරමි. මඩොල්සිම ප්‍රදේශයේ යම් කිසි සංවධර්න කටයුත්තක් ආරම්භ කරනවා නම් මා දැනුවත් කිරිමට කටයුතු කරන ලෙස පසුගිය සභා වාරයකදී ද මා ප්‍රකාශ කළ නමුත් මෙම මුල්ගල තැබිමේ අවස්ථාව පිළිබඳව ද මා දැනුවත් නොකිරිම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි. කෙසේ නමුත් ගැටළුකාරි තත්ත්වයන් හමුවේ වුවද සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත මෙම සතොස ආයතනය මඩොල්සිම ප්‍රදේශයේ ආරම්භ කිරිමට අවස්ථාව ලබා දෙන ලෙස නැවත නැවතත් ඉල්ලා සිටිමි

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ඇකිරිය ප්‍රදේශයේ නිවාස ගම්මානය විවෘත කිරිමේ රාජ්‍ය උත්සවය එළඹෙන මාතර්ු 03 දින පෙ.ව.9.30 ට නිවාස ගරු රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරිමට නියමිත බැවින් එදිනට සියළුම ගරු මන්ත්‍රීවරුන් සහභාගි වන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මඩොල්සිම නගරයේ සතොස ආයතනයක් ස්ථාපිත කිරිම පිළිබඳව අපෙගේ විරුධතාවයක් නොමැත. මන්ද එහි ලියකියවිලි පිළිබඳව අප දැනවත් කොට නොමැති බැවින් එම ක්‍රමවේදය සඳහායි අපි විරුද්ධ වන්නේ. 2012 වසරේ දී ලුණුගල බස් නැවතුම්පල ඉදි කිරිමේ යෝජනාව අනුමත වුයේ ද මෙලෙසයි. නමුත් එහි අනිසි විපාක මේ වන විට අප භුක්ති විඳිමින් සිටිනවා. කෙසේ නමුත් මෙම ගොඩනැගිල්ලේ සැළැස්ම හෝ සභා ගත කිරිම කළ යුතුව තිබුනි.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා**

මෙම අවස්ථාව සඳහා කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරයා හෝ දැනුවත් කර නොමැති වීම තුලින්ම මෙහි ක්‍රමවේදයේ ගැටළුවක් පවතින බව අවබෝධ වනවා. සභා ලේකම්තුමාට හෝ මේ පිළිබඳව දැනුවත් කිරිමට හැකියාව තිබු නමුත් එලෙස කටයුතු නොකිරිම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරමි.

ඒ අනුව, මඩොල්සිම සතොස ගොඩනැගිල්ල මඩොල්සිම පුස්තකාල ගොඩනැගිල්ලේ ඉහල මහලයේ ඉදිකිරීමටත්, ඒ සඳහා ලුණුගල ප්‍රාදේශිය සභාවේ ස්ථාවර තැන්පත් ගිණුමෙහි මුදල් ලබාගැනීමටත් සභාවේ ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-**

**05/1/7.** සියලුම ග්‍රාම නිළධාරි වසම් නියෝජනය වන පරිදි ගරු මන්ත්‍රීවරුන් වෙත පොල් පැළ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

විධිමත් පරිදි අධීක්ෂණ කර ලබා දෙන්න. පසුගිය කාලයේ බොහෝ පිරිසක් අවිධිමත් ලෙස පොල් පැල ලබා දී තිබෙනවා. ඇතැම් අය මේ වන තුරුත් පොල් පැල සිටුවා නොමැත. මන්ද ඒ සඳහා ඉඩම් හෝ ඔවුන් සතුව නොමැති වීම හේතුවෙනි.

**<u>ගරු මන්ත්‍රී තිලකසිරි දිසානායක මැතිතුමා</u>**

පොල් සංවර්ධන කායර්ාලයේ නිළධාරි මහතෙකු යොදවා දැනුවත් කොට විධිමත් පරිදි පොල් පැල ලබා දෙන්න. නැතිනම් ඉඩම් නොමැති අය පවා පැල ලබා ගනු ලබනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.</u>**

සංකේතාත්මකව පොල් පැල 02 ක් ලබා දෙන්න. ඉතිරි පැල විධිමත් පරිදි ලබා දෙන්න. එසේ නොමැති නම් හාල් කිලෝ 05 ක් හෝ ලබා දෙන්න.එය වඩාත් ඵලදායි වේ.

**<u>05/1. ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ යෝජනා :-</u>**

**05/1/8.** ලුණුගල ප්‍රාදේශිය සභාව සතු නව වෙළඳ සංකීණර්යේ අංක 09 කඩකාමරය ඒ.එම්.විජේසිරි මහතා විසින් ටෙන්ඩර් ලබාගත් අතර, එම අය හදිසි හෘදයාබාදයෙන් මිය ගියේය. නමුත් ටෙන්ඩර් ලබාගත් අය අදාළ කඩකාමරයේ මුළු මුදල නොගෙවූ අතර, එම අයගේ බිරිඳ වන ඩී.එම්.චන්ද්‍රලතා මිය විසින් එම හිඟ මුදල ගෙවීම සඳහා සහන කාලයක් ලබාදෙන ලෙසත්, ඉදිරියේදී ගිවිසුම් ගත වී තමාගේ නමට කඩකාමරය පවරාදෙන ලෙස ඉල්ලීමක් කර ඇත. එහෙයින් නව වෙළඳ සංකීණර්යේ අංක 09 කඩකාමරයේ හිඟ මුදල මාස 02 ක් ඇතුලත ගෙවීමට කල් ලබාදීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/2.ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමාගේ යෝජනා.</u>**

**05/2/1.** ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් සියලුම දේවාල වල උදේ 5.30 සිට 6.30 දක්වාත් සවස 6.00 සිට 6.30 දක්වා ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතා කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.</u>**

සභා අනුමැතිය ලැබුනද මේ සම්බන්ධව ප්‍රාදේශිය සංවර්ධන කමිටුව දැනුවත් කරන්න. එවිට ගැටළුවක් ඇති නොවේ.

**<u>05/2.ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමාගේ යෝජනා.</u>**

**05/2/2.** මඩොල්සිම සිට ඇකිරිය දක්වා ගමන් කරන මාගර්යේ ප්‍රතිසංස්කරණ කටයුතු අතර මහ නතර කර ඇත. මෙයට හේතුව කුමක්ද යන්න අදාළ ආයතනය වන කොමති ආයතනයෙන් විමසීමට අවශ්‍ය කටයුතු කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ වන විට මිගහකිවුල මාගර්යේ ඉදි කිරීම් අවසානයි. ලුණුගල ප්‍රදේශයේ මාගර් 03 ක් වැඩ ආරම්භ කොට තිබෙන අතර එහි වැඩ අවසන් වූ වහාම ඇකිරිය මාගර්ය සකස් කිරිම සිදු කෙරේ.

**<u>ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා.</u>**

ඇකිරිය මාගර්ය සැකසීම ප්‍රමාද වීම තුලින් තිබෙන මාගර්ය ද දැඩි ලෙස අබලන් වෙනවා. බෝක්කු ද මේ වන විට දැඩි ලෙස අබලන් වී තිබෙනවා. මීට පෙර වි.15 කින් කුරුවිගොල්ල සිට මඩොල්සිම දක්වා වාහනයකින් ගමන් කළ හැකි වුවද මේ වන විට ඒ සඳහා විනාඩි 45 ක් පමණ ගත වීම කණගාටුවට කරුණකි.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා.</u>**

සභාවේ සියලුම ගරු මන්ත්‍රිවරුන්ගේ එකඟතාවය මත අත්සන් ලේඛණයක් සකසා අදාළ ආයතන වෙත යොමු කිරිම සුදුසු බවයි මගේ හැඟිම.

**<u>05/2.ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමාගේ යෝජනා.</u>**

**05/2/3.** කොමති ආයතනය ගල්ලුල්ල එවන්ජර් ක්‍රීඩා සමාජයට ක්‍රීඩාපිටිය සකස් කර දෙන බවට පවසා පස් ක්‍රීඩාපිටියේ ගොඩ ගසා ඇති අතර, මේ වනවිටත් එම කටයුත්ත ඉටු වී නොමැති බැවින්, අදාළ ක්‍රීඩා

සමාජයේ සභාපති, කොට්ඨාශ මන්ත්‍රී සමඟ සාකච්ඡා කර එම පස් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස කොමති ආයතනය වෙත සභාවේ අනුමැතිය සහිත ලිපියක් යවන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

එම වසමේ ග්‍රාම නිළධාරි හමුවවූ විට පැවසුයේ පස් ඉවත් කර ගන්නා පොරොන්දුව මත එම ආයතනයට පස් දැම්මට එකඟතාවය ලබා දුන් බවයි.

**<u>05/3. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා</u>**

**05/3/1.** යපම්ම බේසම දියනාන ස්ථානය සහ වාහන නැවතුම්පල වැසිකිලිය සංවධර්නය කිරීමට යෝජනා කරමි. තවද එහි සැළසුම් සැකසීමේදි මා දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/2.** ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ පහසුකම් ලබාදීම සඳහා හඳුනාගත් ඉතාම අවම මුදලකින් සහ තිබෙන පහසුකම් වලින් සහ ස්වභාවික සම්පත් වලින් ක්‍රියාත්මක කල හැකි යෝජනා, ක්‍රියාත්මක කළ යෝජනා අනාගතය වෙනුවෙන් කල හැකි කඩිනමින් කල යුතු විශාල පිරිවැයක් දරා කල යුතු යෝජනා සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

1. ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ මල්ලක් මාස 06 ක් ලබා දීම
රු.300.00*300=90000.00*6=5400000.00 (පනස් හතර ලක්ෂයයි)

2. ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් සඳහා වෂර්යකට රු.50000.00 බැගින් ලබා දීම
50000*40=2000000.00(විසි ලක්ෂයයි)

ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දහම් පාසල් සඳහා වෂර්යකට රු.50000.00 බැගින් ලබා දීම.
50000*60=3000000.00(තිස් ලක්ෂයයි)

ලුණුගල ප්‍රාදේශිය සභා සේවක සුභ සාධනයට
මසකට 200000.00 වෂර්යකට 2400000.00 (විසි හතර ලක්ෂයයි)

ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ දරුවන්ට/වැඩිහිටියන්ට ඉංග්‍රංසි දැනුම වධර්නය සඳහා අමතර පංති පවත්වනවා සහ සා/පෙළ, උ.පෙළ දරුවන්
25000.00*8=200000.00 (විසිහතර ලක්ෂයයි)

ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ 9 වසරෙන් ඉහල දරුවන් සඳහා වෘත්තිය පුහුණු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී වෘත්තිය පුහුණුව ලබා දී රැකියා 1000 ක් පුද්ගලික අංශයේ සොයා දෙනවා.
(රු.30000.00 ඉහල) වෂර්යකට 2400000.00 (විසි හතර ලක්ෂයයි) 17600000.00

ලුණුගල සහ මඩුල්සිම නගර අලංකරණය සඳහා (විසි හතර ලක්ෂයයි) 2000000.00

වගා කල හැකි සියළුම කුඹුරු වගා කිරිමට සහයෝගය ලබා දෙනවා
ට්‍රැක්ටර් 02 නගුල් (හතලිස් ලක්ෂයයි) 4000000.00

දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනවා ( දස ලක්ෂයයි) 1000000.00

ලුණුගල ප්‍රාදේශිය සබා බල ප්‍රදේශයේ අසරණ පවුල් 3ට වෂර්යකට නිවාස 3
බැගින් ඉදි කරමි.(තිස් ලක්ෂයයි) 3000000.00

රිලා/දඬුලේනා ඇතුලු සතුන්ගෙන් වන බෝග හානිය සඳහා ස්ථිර
වැඩ පිළිවෙලක්, කොස්, මී වැනි ගස් වගර් 5000 ක් රජයේ රක්ෂිත
මායිම් වල පැල කර රැක බලා ගනිමි. (දස ලක්ෂයයි) 1000000.00

ඉහත වැඩසටහන් සියල්ල සඳහා මා විසින් අලුතින් නිරාමිණය කරන ලද ආදායම් මාගර් 11 න් උපයා ගන්නා ආදායම යොදවමි.

01.වාහන නැවතුම් ගාස්තු අය කිරිම, ආයෝජනය - රු.10000.00(දහදාහකි)
මසකට සේවකයින් - 01 වෂර්යකට
181000.00 2172000.00
නිල ඇඳුම් - 02 බිල්පොත් 20

02.බහු කායර් ගොඩනැගිල්ලේ කාමර 04 ක් කුලියට දීම මඟින්
ආයෝජනය රු.1000000.00(ලක්ෂ 10)
මසකට සේවකයින් - 01 වෂර්යකට
107500.00 1290000.00

03.කොකාගල පුංචි ලෝකාන්තය ආයෝජනය රු.ලක්ෂ 15
මසකට 280000.00 සේවකයින් 01 වෂර්යකට 7290000.00

04.පීස්ස දිය ඇල්ල ආයෝජනය ලක්ෂ 10
මසකට 280000.00 සේවකයින් 01 වෂර්යකට 3366000.00

05.යපම්ම බේසම දිය නාන ස්ථානය ආයෝජනය ලක්ෂ 10
මසකට 93000.00 සේවකයින් 01 වෂර්යකට 116000.00

06.ප්‍රාදේශිය සභා සභන වෙළඳසැල ආයෝජනය ලක්ෂ 15
මසකට 125000.00 සේවකයින් 03 වෂර්යකට 1500000.00

07.ලුණුගල ප්‍රාදේශිය සභා මාළු වෙළඳසැල ආයෝජනය ලක්ෂ 8
මසකට 900000.00 සේවකයින් 4 වෂර්යකට 11800000.00

08.නයි මිරිස් වගාව ආයෝජනය 25000.00
සේවකයින් 2 ආදායම 750000.00

මෙම සියළුම වැඩසටහන් සඳහා යොදවා ගන්නේ දැනට ප්‍රාදේශිය සභාවේ අතිරික්ත සේවකයින්

09.නව කඩ කාමර 30 ක් ඉදි කිරිම
මසකට 90000.00 වාෂරීකව 1080000.00

10.ජේ.සි.බි.යන්ත්‍රයේ ආදායම
මසකට 69400.00 (දැනට පාඩුව) වෂර්යකට 832800.00 (පාඩුව)

නව කළමනාකාරිත්වය යටතේ ආදායම
මසකට 129055.33 වෂර්යකට :- 1548664.00

11.පීස්ස ජල විදුලි බලාගාර 02 මසකට ආදායම 250000.00 වෂර්යකට ආදායම 3000000.00
එකතුව : 35912000.00 රු.ලක්ෂ 359 2023 වෂර්යේ ආදායම

**01.වාහන නැවතුම් ගාස්තු අය කිරිම**
ලුණුගල නගරය
ලොරි රථ 35*100 = 3500.00
පැයකට 25
වෑන් රථ 25*50 = 1250.00
ත්‍රි රෝද රථ 25*100 = 2500.00
7250.00

දිනකට 7250*දින 25 = 181000.00
මසකට 181000.00*12 වෂර්යකට = 2172000.00
**(බහුකායර් කම්කරු මහත්ම මහත්මීන් යොදවා අය කර ගත හැක)**

**02.බහුකායර් ගොඩනැගිල්ල කාමර 04 ක් සාදා දිනපතා කුලියට දීම**
එක් කාමරයක් 1250.00*3 = 3750.00
3750*25 = 107500.00
වෂර්යකට 107500.00*12 =1290000.00
**(දැනට සිටින මුරකරු මහතා යොදවා පාලනය කළ හැක)**
**03.කොකාගල පුංචි ලෝකාන්තය**
ආයෝජනය = 1500000.00
නැරඹීමට දිනකට 200*30*6000*50 = 300000.00
කඳවුරු භූමිය 250*30*750*250*750 = 187500.00
වෂර්යකට 487500.00*12*7200= 5850000.00
වාහන 6*30*180*100 = 1440000.00 මි.7.290 = 7290000.00

**04.පීස්ස දිය ඇල්ල ආයෝජනය රු.මි.1.00**
100*30*3000*50 =150000.00
වාහන 6*30*180*100 =18000.00
=168000.00
වෂර්යකට 168000.00*12=2016000.00
කඳවුරු භූමිය 15*30*450*12*5400*250 =1350000.00
= 3366000.00
**05.යපම්ම බේසම දිය නාන ස්ථානය මි.3.366**
දිනකට 40*30=1200.00*30 =36000.00
වාහන 6*30*180*100 =12000.00
කඳවුරු භූමිය 6*30*180=250 =45000.00
=93000.00
93000.00*12=1116000.00
ආයෝජනය මි.1.00

**06.ලුණුගල ප්‍රාදේශීය සභා සහන වෙළඳසැල**
දැනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ අතිරික්ත සේවක මහත්ම මහත්මීන් යොදවා සභාවේ කෘ කැබ් රථය යොදවාගෙන දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් එළවලු පළතුරු සහල් ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ සහන මිළට ලබා දීම මඟින් දිනකට අවම වශයෙන් රු.5000.00 ක් උපයා ගැනීමට බලාපොරොත්තු වේ. සම්පූණර් ආයෝජනය රු.1500000.00.
500*25=125000.00
125000.00 * 12 = 1500000.00
මි.1.5

**07. ලුණුගල ප්‍රාදේශීය සභා මාලු වෙළඳසැල**
දිනකට මාළු කිලෝ 200 (200*30*6000)
6000*150 = 900000.00
මසකට 900000.00*12 =11800000.00
වෂර්යකට රු.මි.11.80
අප බල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රෝටින්/විටමින් අවශ්‍යතාවයට සහයකි
සම්පූණර් ආයෝජනය රු.800000.00

**08.නයි මිරිස් වගාව.**
සම්පූණර් ආයෝජනය රු.25000.00 ආදායම 750000.00 මිරිස් පැළ 300 එක් බඳුනකින් වෂර්යකට මිරිස් කිලෝ 05 බැගින් ලැබුනහොත් (දහයක් දක්වා යා හැක)
කිලෝ 1*300*900*500 = 750000.00
දැනට රටේ තිබෙන ආහාර අබර්ුදයට මහත් පිටිවහලකි

**9.පීස්ස ජල විදුලි බලාගාර.**

පීස්ස ජල විදුලි බලාගාර 2 පවරාගෙන අඩුපාඩු සකසා ජාතික ජල විදුලි පද්ධතියට එක්කර මසකට රු.ලක්ෂ 2 ½ ක ආදායමක් ලබනවා.

මසකට 250000.00 වෂර්යකට 3000000.00

ආයෝජනය රු.ලක්ෂ 25 යි

දැනට රටේ තිබෙන විදුලි අබර්දයට යම් සහනයක් වේ.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/3.** ලුණුගල ප්‍රාදේශීය සභාවේ ආදායම වැඩිකිරීමට, වියදම අඩු කිරීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/4.** ලුණුගල මධ්‍ය මහා විදුහලේ ඉගෙන ගත් එල්.එම්.ඩයස් ධමර්සේන මහතා ශ්‍රී ලංකා විභාග කොමසාරිස් තනතුරට පත්වීමද, ලුණුගල මධ්‍ය මහා විදුහලේ ඉගෙන ගත් සුසන්ත ජයමාන්න මාගේ ඥාති සහෝදරයා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති දූරයට පත්වීමද සහ ලුණුගල මධ්‍ය මහා විදුහලේ ඉගෙන ගත් කොළඹ එන්.අයි.බී.එම්.ආයතනයේ තමන්ගේම වියදමින් උපාධිය හදාරන 16 හැවිරිදි ඉසිර ආදිත්‍ය දිරිය පුතා පසුගිය දුෂ්කර වසර දෙක තුල විදේශ විනිමය ඩෝලර් 75000.00 මුදලක් ලංකාවට රැගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව ලුණුගල ජනතාව නියෝජිතයෙක් විදිහට හදපිරි ස්තුතිය ප්‍රණාමය පුද කිරීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු මන්ත්‍රී පි.සුබ්‍රමනියම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/4. ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමාගේ යෝජනා.</u>**

**05/4/1.** 2022 වෂර්ය සදහා පහත සදහන් යෝජනා ක්‍රියාත්මක කිරිම සදහා අනුමැතිය ලබාගැනීමට යෝජනා කරමි.

1. මිල්ලබැද්ද ගම්වාසින්ට පානිය ජලය ලබා දීම.
2. තලගොල්ල පැති බැම්ම පස් පුරවා සමතලා කිරිම
3. සෙල්වපුරම් ගම්මානයට පානිය ජලය ලබා දීම.
4. යටිවර බුබුල ජල මාගර්යේ කැටියක් ඉදි කිරිම
5. අස්වැද්දුම මාගර්ය කොන්ක්‍රිට් කිරිම.
6. තලගොල්ල මාගර්යේ පැති බැම්මක් සෑදිම
7. 19 කණුව බී කොටස මාගර්ය සංවධර්නය කිරිම

ඉහත යෝජනාව ගරු උප සභාපති ඩී.සෙල්වරාණි මැතිනිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/5. ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමාගේ යෝජනා.</u>**

**05/5/1.** මාගේ සභා අරමුදල් ප්‍රතිපාදන වලින් සුමුදු කොට්ඨාශයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජය 07 ක් සඳහා ක්‍රීඩා භාණ්ඩ (අත්පන්දු දැල්, ක්‍රිකට් ක්‍රීඩා උපකරණ කට්ටල) රු.75000.00 කට යටත්ව ලබාදීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/5/2.** මාගේ සභා අරමුදල් ප්‍රතිපාදන වලින් ස්වින්ටන් ඉරුදය ආණ්ඩවර් ක්‍රිස්තියානි පල්ලිය සඳහා ශබ්ද විකාශන යන්ත්‍රයක් රු.75000.00 යටත්ව ලබාදීමට යෝජනා කරමි.
ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>06. කාරක සභා වල වාතර්ා ඉදිරිපත් කිරිම.</u>**

**<u>06/1. මුදල් කමිටු වාතර්ාව</u>**

2022.01.27 හා 2022.02.08 වන දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ කමිටු ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**<u>06/1/1. සංශෝධන</u>**

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා.</u>**

PPTA අරමුදල් යටතේ මේ වසරේදි කොතරම් මුදල් ප්‍රමාණයක් ලැබී තිබෙනවාද?

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මිළදි ගැනිම් කිසිවක් සිදු කොට නැත. පළාත් පාලනයෙන් ටෙන්ඩර් කිරිම් කටයුතු සිදු කරනු ලබනවා. බොහෝ දුරට මිලදි ගැනිම් සිදු කොට ඇත්තේ වාහන සඳහාය.

**<u>ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා</u>**

12 කරුණට අදාළව අත්තන්ගොල්ල මාගර්ය සඳහා ගල් කියුබ් 09 ක් දැමිම ගැටළු සහගත කරුණකි.රු.96000.00ක සේවයක් සිදු වී නැත. ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා සහ මා විසින් බොහෝ අවස්ථා වලදි මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කල ද එය ක්‍රියාත්මක වුයේ නැත. වසමේ සංවධර්න නිළධාරි තුමිය හා ග්‍රාම නිළධාරි හා එක්ව මාගර්යේ පස් පිරවීම සිදු කරනු ලැබුවා.කාමරීක නිළධාරි මහතාගේ අධික්ෂණය මඟින් විධිමත් පරිදි මෙම කායර්ය සිදු කළා නම් මීට වඩා අඩු වියදමකින් මෙම කායර්ය සිදු කළ හැකි වනවා ඇත.

**<u>ගරු මන්ත්‍රි.එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.</u>**

එතුමාගේ අදහස් දැක්විම පිළිබදව මා කණගාටුව ප්‍රකාශ කරනවා.මේ සම්බන්ධව එතුමා දැනුවත් නොවුනද ප්‍රදේශවාසින් බොහෝ දෙනා මේ සම්බන්ධව මා වෙත ප්‍රසංශා ඉදිරිපත් කලා. ගල් කියුබ් 09 ක් ලබා ගැනිම සම්බන්ධව සාක්ෂි තිබෙනවා.කොට්ඨාශයේ ගරු මන්ත්‍රිතුමාහට සිදු කළ නොහැකි කායර්යක් මා විසින් සිදු කිරිම සම්බන්ධව බොහෝ ප්‍රදේශවාසින් සතුටට පත් වුවා. මගේ දැක්ම වනුයේ යම් කායර්යක් ඉටු කරන්නේ නම් එය තමා සැහිමකට පත් නොවුවද එයින් ප්‍රතිලාභ ලබන්නන් සැහිමකට පත්වන්නේ නම් එයයි එයින් ලබන සාථර්කත්වය.

**<u>ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා</u>**

රු.96000.00 ක් වැය කොට කොන්ක්‍රිට් දැමීමට හැකියාව තිබියදී මෙලෙස මුදල් නාස්ති කිරිම සම්බන්ධව කණගාටු වෙනවා.

**<u>ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එම මාගර්යට ABC දමන්න කියා මිට පෙර මා විසින් යෝජනාවක් ඉදිරිපත් කළා. නමුත් එය ක්‍රියාක්මත නොකර මාගර්යට පස් දමා තිබුනා. අනතුරුව එම පස් මඩ වීමක් සිදු වු අතර එය වසා දැම්මට ගල් දමා තිබෙනවා.අප සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රය, සේවකයින් පවතිද්දී මෙලෙස කටයුතු කිරිම ගැටළු සහගතය. වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනුයේ ගල් කියුබ් 09 ක් මෙම මාගර්යට යොදා නොමැති බවයි. ඉන් කොටස් වශයෙන් සමගිපුර මාගර්යට හා පල්ලේපංගුව මාගර්යට යොදා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රි එම්.බි.සමන් කුමාර මැතිතුමා</u>**

එම හේතුන් මතයි මා පැවසුයේ අත්තනගොල්ල මාගර්යට ගල් කියුබ් 09 ක් යොදා නැති බව.

**<u>ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මීට පෙර ද අත්තනගොල්ල මාගර්යේ කාණුවක් සකස් කරා. එයද විධිමත් නොවන අයුරින් ඉදි කර තිබෙනවා. එහිදි මුදල් අපතේ යාමක් සිදු වී තිබිම පිළිබදව කණගාටුව ප්‍රකාශ කරනවා.

එසේම මුදල් කමිටු වාතර්ාවේ ටයර් මිළදි ගැනිම පිළිබදව මා විසින් ඉදිරිපත් කල යෝජනාව ක්‍රියාත්මක කර නොමැති බව දක්නට ලැබෙනවා.

**<u>ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

DAC කරන්න පුළුවන්. නමුත් රාජ්‍ය ආයතනයක එලෙස සිදු කිරිම වගකීම් විරහිත ක්‍රියාවක්.

**<u>ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මුදල් කමිටු වාතර්ාවේ 15 කරුණට අදාළව විදි ලාම්පු යොදා ඇත්තේ කොහේද? නගරයේ යම් ස්ථානයක යොදා ඇති වීදි ලාම්පුවක් මාස 03 ක් පුරා දැල්වි තිබෙනවා. එලෙස පැවතීම සභාවට අහිතකර තත්ත්වයක්. අවට වෙසෙන්නන් එම බල්බයේ ක්‍රියාකාරිත්වය පාලනය නොකරන්නේ නම් බල්බ ආධාරකය සමඟ ගලවා ගෙන ඒම සුදුසු බවයි මගේ හැඟිම.

එසේම ඇගිලි සලකුණු යන්ත්‍රය කිහිප අවස්ථාවකදීම නඩත්තු කොට තිබෙනවා. එය විධිමත් ලෙස සකස් කර දෙන මෙන් කඩිනමින් එම ආයතනය දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

**2022.01.27 හා 2022.02.08 වන දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ ඉහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

**06/2. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාතර්ාව - නැත**

**06/3. පරිසර හා පහසුකම් කමිටු වාතර්ාව - නැත**

**06/4. කාමරීක සේවා කමිටුව**

2022.02.15 වන දින පැවති කාමරීක කමිටු වාතර්ාව කමිටුවේ සභාපති එම්.බී.සමන්කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**06/4/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා.**

ප්‍රථමයෙන්ම කමර්ාන්ත කමිටුවේ සභාපතිධූරය සඳහා මා තෝරා පත් කර ගැනිම පිළිබඳව මාගේ ස්තුතිය පුද කරමි.එලෙසම කමර්ාන්ත සඳහා සභාවේ කාමරීක නිළධාරි මහතුන්ගේ දායකත්ව ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා ගරු සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු විය යුතු බව ප්‍රකාශ කරන අතර කමර්ාන්ත වලට අදාළ ගෙවිම් කිරිමට පෙර කමර්ාන්ත කමිටුවේ වාතර්ාව ලබා ගන්නා ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

**2022.02.15 යන දින පැවති කාමරීක කමිටුවේ නිදෙර්ශ ඉහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

## 07. ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ /එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

ලැබිම් සාරාංශයේ 2022 ජනවාරි මාසයේ රු.1,6,13,196.00 ක මුදලක් ලැබි තිබෙනවා. දැන් එම මුදල බැංකුගත වි තිබෙනවාද?

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

අසු ලක්ෂයක් පමණ වියදම් ලෙස දැක්විය හැකි අතර රු.ලක්ෂ 25 පමණ ශේෂයක් පවතිනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා.**

සභාව සතුව බැංකු ගිණුම් කොපමණ ගණනක් තිබෙනවාද?

**ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

01 කි. සාමාන්‍ය ගිණුම

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

රු.ලක්ෂ 95 ක හිඟයක් ජල අංශයේ පැවතිම විශාල ගැටළුවක්. ඒ සඳහා ගත යුතු පියවර පිළිබඳ කඩිනමින් අවධානය යොමු කළ යුතුයි.එසේම බිල්කල මුදලින් අය කිරිම ප්‍රමාණවත් නොවේ.

**ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා.**

ගිය මස බිල්කල මුදලින් ලැබි ඇත්තේ රු.1990.00කි. මා විසින් ගෙවන ලද නිවසේ ජල බිල්පතෙහි වටිනාකම ද එම බිල්කල මුදලින් ලද වටිනාකමට ආසන්න අගයකි.එබැවින් මෙලෙස හිඟ එකතු විම වලක්වාලීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසිය යුතු වේ.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා.**

මෙම හිඟ අයකර ගැනිම සඳහා ජල අංශයේ නිළධාරින් උත්සහගත යුතුය.මීට පෙර සේවයේ යෙදී සිටි සභා ලේකම්තුමිය එලෙස හිඟ මුදල් අය කිරිම වළක්වාලීම සඳහා අප කායර්ාලයේ නිළධාරින් යොදවා ඔවුන් හට ප්‍රදේශ වෙන් කොට දී අදාළ පාරිභෝගික ස්ථාන වෙත ගොස් හිඟ අය කර ගැනිම සඳහා ක්‍රමවේදයක් සකසන ලදි.එලෙස වතර්මානයේදීත් කටයුතු කිරිම කාලෝචිතය.මන්ද මෙය සභාවේ ආදායම් තත්ත්වයට ප්‍රහල ලෙස බලපාන ගැටළුවකි.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

නිළධාරින් කණ්ඩායම් ලෙස යොදවා ඉලක්කයක් ලබා දී මෙම හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.**

මෙලෙස හිඟ මුදල් එකතු වීම මාසිකව වැඩි වේ. එලෙස අධික හිඟ මුදලක් ගිණුම් ගත වීම සභාවට අහිතකර තත්ත්වයකි.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා.**

හිඟ මුදල් සම්බන්ධව මීට වඩා සභාවේ අවධානය යොමු විය යුතුයි. මන්ද ජලය යනු අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර එය නිසි පරිදි පාරිභෝගික ජනතාව වෙත ලබා දීම සභාවේ වගකීමකි. එසේම ඒ සඳහා මුදල් ගෙවිම පාරිභෝගිකයින්ගේ යුතුකමක් වන අතර එය එලෙස අය වන්නේ නොමැති නම් ඒ වෙනුවෙන් යොදවා ඇති විෂය නිළධාරින්ගේ කායර්භාරය වන්නේ එය විධිමත් පරිදි අය කර ගැනිම සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීමයි.

ගරු සභාපතිතුමා නිතරම සභාවේ රැදී නොසිටින හෙයින් රාජකාරි පිළිබඳව වැඩි වගකීමක් ඇති සභා ලේකම්තුමා මේ පිළිබඳව දැඩි අවධානය යොමු කොට නිළධාරින්ගේ සක්‍රිය දායකත්වය හිඟ අය කර ගැනිම සඳහා ලබා ගැනිමට කටයුතු කළ යුතුය.

__ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා__

හිඟ ආදායම් වාතර්ාවේ ගැටළු සහගත බවක් දක්නට ලැබෙනවා. එය විධිමත් කරන්න. එසේම අප ආයතනය සතු ආරම්භ කිරිමට නියමිත ජල පරික්ෂණාගාරය යනු ඉතා වැදගත් කායර්යක් ඉටු කරනු ලබන ආයතනයකි. ඒ තුලින් ජලයේ ඇති සංයුතිය, පිරිසිදුභාවය ආදි විශාල පරාසයක තොරතුරු පිළිබඳව අධ්‍යනය කරනු ලබන ආයතනයකි. එලෙස ක්‍රියා කිරිමට නම් ඒ පිළිබඳව දැනුමක් පවතින සුදුසු නිළධාරින් ඒ සඳහා සේවයට බඳවා ගත යුතුය.

__ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා__

ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්.

**2022 ජනවාරි මස ලැබීම්, ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ හා එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු යැය ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව එම වාතර්ාව සභා සම්මත විය.**

**08. වෙනත් කරුණු**

__ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා__

බහුකායර් ගොඩනැගිල්ල 2019 වසරේ සිට පිළිවෙලට කුලියට ලබා දීම් සිදු කොට තිබෙනවා. එම වසරේ උත්සව 41 ක් පවත්වා තිබෙන අතර ආදායම ලක්ෂ 08 ක් ලැබී තිබෙනවා.එහිදී අපගේ අරමුණු වූ ආදායම් මට්ටමට ලඟා වී තිබෙනවා. නමුත් කොවිඩ් සමයේදීත් කුලියට දිම් සිදු කර තිබිම ගැටළු සහගතය.

__ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා__

ඒ පිළිබඳව මිට පෙර සභා තීරණයක් ගෙන තිබෙනවා.

__ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා__

ඒ පිළිබඳව කිසිදු තීරණයක් ගෙන නැත.2021 ජනවාරි මාසය වනතුරු කිසිදු ගැටළුවකින් තොරව කුලියට ලබා දී තිබෙනවා. ඉන් අනතුරුව බොහෝ අවස්ථා වලදී නොමිලේ ලබා දී තිබෙනවා. ගරු මන්ත්‍රිවරුන්ගේ හිතවතුන්ට නොමිලේ ලබා දීමට සිදු වුවහොත් එය විශාල ගැටළුවක් වනු ඇත. එසේම අයවැයෙන් පසුව නොමිලේ ලබා දීම් දක්නට ලැබෙනවා.

__ගරු සභාපති සි.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා__

රජය අනුග්‍රහයෙන් සිදු කරනු ලබන යම් කායර්යක් වේ නම් ඒ සඳහා ගොඩනැගිල්ල නොමිලේ ලබා දිය යුතු වනවා.

__ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා__

අහිංසක මිනිසුන්ගෙන් මුදල් අය කරන්න එපා. මේ වනතෙක් අඩු ආදායම්ලාභි කිසිදු අයෙකුට එලෙස නොමිලේ ලබා දී නොමැත. ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමාගේ දරුවන්ගේ විවාහ උත්සව සඳහා ද මුදල් ගෙවීමෙන් අනතුරුවයි එතුම එම ශාලාව කුලියට ලබා ගෙන ඇත්තේ.එය අගය කළ යුතුය.

__ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා__

මෙලෙස ශාලාව නොමිලේ ලබා දීම් තුලින් සභාවේ ආදායමට විශාල ගැටළුවක් මතුවේ.එබැවින් පොදුවේ සියලු දෙනාටම ගාස්තු අය කිරිමෙන් අනතුරුව කුලියට ලබා දීමට තීරණය කළ යුතුය.

__ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා__

අප ආයතනය සතුව මේ වන විට මාළු වෙළඳසැල්, ගව මස් වෙළඳසැල් නැත. නමුත් නගරයේ සෑම තැනම මස් හා මාළු වෙලඳසැල් දක්නට ලැබෙනවා.2014 වසරේ ගව මස් වෙළඳසැල ලක්ෂ 15 ට ටෙන්ඩර් කළ අතර මේ වන විට එහි අගය තවත් ඉහල නැගිය යුතුය. නමුත් එහි ආදායම මේ වන විට අප ආයතනයෙන් ගිලිහී ගොස් තිබිම කණගාටුවට කරුණකි.

__ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.__

ගව මස් වෙළඳසැල ටෙන්ඩර් කරන්නේ නැතිනම් වෙළඳ බලපත්‍රයක් ලබා දීමට කටයුතු කළ යුතුය.නැතිනම් අලුපොත වැනි ප්‍රදේශ වලින් ගව මස් රැගෙනවිත් එම රිසිට් පත ඉදිරිපත් කරමින් ගව මස් විකිණිම සිදු කරනු ලබනවා. එහි නීත්‍යානුකූල බවක් තිබෙනවා. නමුත් ඒ තුලින් සභාවට ලැබිය යුතු ආදායම

අභිමි වනවා.මාගේ ව්‍යාපාරය වෙනුවෙන් ද වාෂර්ීකව යම් ගෙවීම් කිරීමක් බලපත්‍ර ලබා ගැනිම වෙනුවෙන් වැය කරනවා.එලෙස බලපත්‍ර නිකුත් කිරිම තුලින් හෝ ආදායම තර කර ගැනීමට උත්සහ ගත යුතුය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

බහු කායර්ය ගොඩනැගිල්ලේ පැමිණිම් ලේඛණයක් නඩත්තු වනවා. නමුත් එහි දින, රිසිට් අංක, පැමිණි ප්‍රමාණය හෝ මහජන සෞඛ්‍ය පරික්ෂක නිදෙර්ශය හෝ නොමැත. සනිපාරක්ෂක දියර පොතෙහි තැවරිම හේතුවෙන් ඇතැම් දත්ත මැකී ගොස් තිබෙනවා. පැමිණිම් ලේඛණයක් සදහා මා විසින් පොත් ලබා දීමට කැමැත්ත පළ කරන අතර විධිමත්ව එය නඩත්තු කිරිමට කටයුතු කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා</u>**

රු.25000.00 ක් ගෙවා සාමාජ්‍ය මිනිසුන් උත්සවයක් සදහා ශාලාව කුලියට ලබා ගත්තද දේශපාලන රැස්වීම් සදහා පැමිණෙන ප්‍රමාණය පිළිබදව නියාමනයක් නොමැත. එවැනි අවස්ථා වලින් සභාවට ආදායම් අවස්ථාවක් ලැබෙන්නේ නැත.ඉදිරියේදී පැවැත්වීමට නියමිත මගේ දරුවාගේ විවාහ උත්සවය සදහා මෙම ශාලාව වෙන් කොටගෙන තිබෙනවා. නමුත් ඒ සදහා අදම මුදල් ගෙවීමට මා සුදානම්.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

අප්‍රේල් 01 වන දින සිට සියලු දෙනාගෙන්ම මුදල් අය කිරිමේ තීරණය ක්‍රියාත්මක කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජයවීර අබේකෝන් මැතිතුමා</u>**

මාස 02 ට පමණ පෙර සිට ගල්ලුල්ල මාගර්ය සකස් කිරිම සදහා ජේ.සී.බී.යන්ත්‍රය වෙන් කර ගෙන දෙන මෙන් ඉල්ලීමක් කර තිබෙනවා.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

නිවාස ගම්මානය විවෘත කිරිමේ උත්සවය වෙනුවෙන් 25,26 දෙදින ඇකිරිය ප්‍රදේශය සදහා ජේ.සී.බී.යන්ත්‍රය වෙන් කර ගෙන තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

පස්සර ප්‍රාදේශිය සභාවේ ඉන්ධනත් සමග ජේ.සී.බී.යන්ත්‍රය මාගේ හිතවතෙක් විසින් පැයක් සදහා රු.3000.00 ක් ගෙවීම් කරමින් ලබා ගෙන තිබෙනවා. එසේම බිබිල ප්‍රදේශයේ බැකෝ ලෝඩර් යන්ත්‍ර 02 ක් අප ප්‍රදේශයේ සේවයේ යෙදෙනු ලබයි. නමුත් අප ආයතනයේ පවතින බැකෝ ලෝඩර් යන්ත්‍රය මාසෙටම පැය 250 ක් පමණක් සේවයේ යෙදිම ගැටළු සහගතය.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

එය අපගේ අඩුපාඩුවකි.ආදායම ලබා ගැනිම ක්‍රමවත් කළ යුතුය. සභිකයින් විසින් බැකෝ ලෝඩර් යන්ත්‍රය වෙන් කරවා ගන්නේ නම් සභා අනුමැතිකින් අනතුරුව ලබා ගැනිමට කටයුතු කරන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා.</u>**

ලුණුගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ඇකිරිය ප්‍රදේශයේ දෙමෝදර කොටසට අයත් ප්‍රදේශයක සංචාරක නිකේතනයක් ඉදි කරන බවට දක්නට ලැබෙනවා. පසුගිය සතියේ එහි ඉදි කිරිම් සදහා සිමෙන්ති ගල් රැගෙනවිත් තිබූ ආකාරය දක්නට ලැබුනා. ඔය ආසන්නයේ පිහිටිම නිසා විශේෂයෙන්ම ඒ පිළිබදව සොයා බලන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා.</u>**

පසුගිය කාලයේදී ලක්ෂ 20 බැගින් වු ව්‍යාපෘති පැමිණියද ඒවා ගිවිසුම් අත්සන් කොට 10% හෝ 20% අත්තිකාරම් ලබා දෙන මෙන් අප ඔබතුමාගෙන් ඉල්ලා සිටියා. එම යෝජනාවන් ක්‍රියාත්මක වූවා නම් මේ වන විට මිලියන ගණනාවක වැඩ කොටසක් ප්‍රදේශය වෙනුවෙන් සිදු කළ හැකිව තිබුනි. එසේ විම ගැන මාගේ කණගාටුව ප්‍රකාශ කරමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

එම ව්‍යාපෘති ලැබුනේ මහාමාගර් අමාත්‍යාංශයෙනි. මෙම ව්‍යාපෘති ලැබී ඇත්තේ පළාත් පාලන අමාත්‍යාංශයෙනි. වෙනත් අමාත්‍යාංශයක වැඩ ඇරඹීම සදහා මුදල් යෙදවිය නොහැකිය.

**<u>ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා.</u>**

පසුගිය මස නිවාස කමිටුව සදහා පැමිණිමට මා වෙත දුරකතන ඇමතුමක් ලැබුනු අතර රාජ්‍ය නිළධාරියෙක් ලෙස විධිමත් පරිදි නිවාඩු ලබා ගෙන ඒ සදහා සහභාගි විමට කායර්ාලයට පැමිණි නමුත් එදින කමිටු වාරය පැවැත්වුයේ නැත.තවත් දිනෙක ද එලෙසම සිදු වු අතර මා බරපතල ලෙස අපහසුතාවයට පත් විය. එබැවින් විධිමත් ලෙස එම කමිටු සංවිධානය කර ගනිමින් සහභාගි විමට දැනුම් දෙන මෙන් ඉල්ලමි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

කපා හැරිම සදහා අවශ්‍ය අනුමැතිය වෙනුවෙන් ගරු ඌව පළාත් ආණ්ඩුකාරතුමා දැනුවත් කොට ඇති අතර ඉන් අනතුරුව එතුමාගෙන් ලැබෙන උපදෙස් මත කපා හැරිම හෝ අය කිරිම සිදු කළ යුතුය.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

මාගේ ඉල්ලීම අනුව රු.ලක්ෂ16.85ක් වැය කොට ඌව පළාත් සංචාරක අමාත්‍යාංශය මඟින් පීස්ස දිය ඇල්ල සංවර්ධනය කිරිම යටතේ වැසිකිළිය හා පඩිපෙළ සැකසිම, නැරඹුම් මැදිරිය සකස් කොට තිබෙනවා. දැන් සභාවට එය පවරා ගත හැකියි. මේ පිළිබඳව අප සභාවේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

**න්‍යාය පත්‍රය අනුව අද දින සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.**

**මීලග මහ සභා රැස්වීම 2022.03.22 වන දින පෙ.ව.10.00 ට පවත්වන බව දැනුම් දුනි.**

(සී.ජගත්චන්ද්‍ර දලුකොටුව),
සභාපති,
ප්‍රාදේශිය සභාව,
ලුණුගල